**ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය - 2019**
**-------------------------------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**
**----------------------------**

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කාර්යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
-----------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**
---------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කාර්යාංශය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කාර්යාංශය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කාර්යාංශයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කාර්යාංශයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස කාර්යාංශයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කාර්යාංශයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කාර්යාංශයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කාර්යාංශයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කාර්යාංශය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2017 වර්ෂයේ මෝටර් රථ ප්‍රත්‍යාගණනය ගිණුම්වලට වැරදි ලෙස ගැලපීම හේතුවෙන් මෝටර් රථ සමුච්ච ක්ෂය වෙන්කිරීමේ ගිණුම රු. 3,158,500ක් වැඩියෙන් දැක්වීම, ප්‍රත්‍යාගණනය ලාභය රු.3,000,000 ක් අඩුවෙන් හා සමුච්ච අරමුදල රු. 158,500 ක් අඩුවෙන් දැක්වීමෙන් සිදුව තිබූ වරද සමාලෝචිත වර්ෂයේදී ද නිවැරදි කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ ක්ෂය රු. 773,557 ක් ගිණුම්ගතකර නොතිබුණි. | මෝටර් රථ පිළිබඳව ගිණුම්කරණ අඩුපාඩුව හඳුනාගෙන නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඉකුත් වර්ෂයේ සිදු වූ වැරදි සමාලෝචිත වර්ෂයේදී නිවැරදි කරගත යුතු බව. |
| (ආ)ඉකුත් වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු පිරිවැය රු.728,967 ක ලිබඩු හා සවිකිරීම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.72,896ක ක්ෂය වෙන් කිරීම් කර තිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි. | සමාලෝචිත වර්ෂයේ කර ඇති ක්ෂය වෙන් කිරීම නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව ක්ෂය වෙන් කිරීම් ගැළපිය යුතු බව. |

### 1.5.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ)ලී බඩු හා සවි කිරීම් | 728,967 | විස්තරාත්මක උපලේඛනයක් හෝ භාණ්ඩ සමීක්ෂණ වාර්තා | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරනු ලබයි. | සාක්ෂි ඉදිරිපත් කළ යුතු බව. |
| (ආ)රැස්වීම්, දිරිගැන්වීමේ සංචාර, සමුළු හා ප්‍රදර්ශණ පැවැත්වීම සඳහා සමාලෝචිත වර්ෂයේ තානාපති කාර්යාල වෙත ලබා දෙන ලද මුදල් | 6,336,020 | වියදම් විස්තර සහ සහතික කරන ලද ගෙවීම් වවුචර් | ගෙවීම් කළ පසු අදාල ගෙවීම් වාර්තා ඉදිරිපත් කරමි. | වියදම් විස්තර සහ සහතික කරන ලද ගෙවීම් වවුචර් ඉදිරිපත් කළ යුතු බව. |

### 1.6 නීතිරීති , රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම.

නීතිරීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවූ අවස්ථා පහත පරිදි විය.

| නීතිරීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2010 අගෝස්තු 18 දින අනුමත කරන ලද කාර්යංශයේ බඳවා ගැනීමේ පරිපාටිය | කාර්යාංශයේ අනුමත බඳවා ගැනීමේ පරිපාටිය බැහැරව අවශ්‍ය සේවා පලපුරුද්ද සපුරා නොමැති නිලධාරිනියක් පත් කර 2018 ජුනි 25 දින සිට 2019 දෙසැම්බර් දක්වා වැටුප්, ඉන්ධන හා වාහන දීමනා, දුරකථන දීමනා, රාජකාරී විදේශ සංචාර දීමනා හා සෞඛ්‍ය රක්ෂණ දායක මුදල් ලෙස රු. 3,825,643 ක් ගෙවා තිබුණි. | ලද අයදුම්පත් ප්‍රමාණයත්, ඒ සඳහා වූ පළපුරුද්දත් සැලකීමේදී අදාල ක්ෂේත්‍රය තුළ වෘත්තීය පුහුණුවක් ලද එකම අයදුම්කාරිය ඇය වූ බැවින් ඇයගේ 2006 ජූලි 14 සිට 2013 ජනවාරි 30 දක්වා වූ කණිෂ්ඨ කළමනාකාරී තනතුර(JM මට්ටම) සැලකිල්ලට ගෙන තිබුණි. | බඳවා ගැනීමේ පටිපාටියට අදාල සුදුසුකම් සපුරා තිබිය යුතු බව |

| | | | |
|---|---|---|---|
| (ආ) ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යාතනයේ 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ මාර්ගෝපදේශ 8.9.1 | මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත්ප්‍රදාන ලිපිය නිකුත් කිරීමෙන් අනතුරුව ඒ සමඟම විධිමත් ගිවිසුමකට එළඹියයුතු නමුත්, සමාලෝචිත වර්ෂයේ උපාය මාර්ග සැලැස්මක් සංවර්ධනය සඳහා රු.5,900,000ක සේවා කොන්ත්‍රාත්තුවක් බාහිර පාර්ශවයකට ප්‍රදානය කර තිබුණද, විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. මේ ගිවිසුම් අත්සන් කර නොතිබියදී කිසිදු ඇප බැඳුම්කරයක් ලබා නොගෙන එම කොන්ත්‍රාත්තුව සඳහා රු. 1,180,000 ක අත්තිකාරම් ගෙවා තිබුණි. | අදාල කොන්ත්‍රාත් ප්‍රදාන ලිපිය සමග අදාල කොන්ත්‍රාත්කරුවන්ගේ ගිවිසුම්ගත ප්‍රකාශයක් ලබා ගෙන ඇත. | මාර්ගෝපදේශය ප්‍රකාරව ගිවිසුමකට එළඹිය යුතු බව. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 253,518 ක ඌණතාවයක් වූ අතර, ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.88,486,989 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 88,740,507 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ සංචාරක සංවර්ධන බදු ආදායම රු.45,015,713 කින් පහළ යාමත්, අලෙවිකරණ සම්බන්ධ වියදම් රු.41,004,551 කින් ඉහළ යාමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1 අරමුදල් ඌන උපයෝජනය**

----------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කාර්යාංශයේ බැංකු ගිණුමෙහි සමාලෝචිත වර්ෂය තුළ පැවති සාමාන්‍ය නිශ්කාර්ය බැංකු ශේෂය රු. මිලියන 216 ක් පමණ වුවත්, මෙකී නිශ්කාර්ය මුදල කාර්යාංශයේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය පිළිබඳ පුරෝකතනයක් කර ඉහල ප්‍රතිලාභයක් ලැබෙන පරිදි ආයෝජනයක් කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මේ පිළිබඳව කටයුතු කිරීමට බලාපොරොත්තු වෙමි. | අරමුදල් ඉහල ප්‍රතිලාභයක් සහිත ආයෝජනයක යෙදවීම කෙරෙහි අවධානය යොමු කළ යුතු බව. |